| | |
|---|---|
| ප්‍රශ්න අංකය | : 1710/'11 |
| අමාත්‍යාංශය | : මුදල් හා ක්‍රම |
| ප්‍රශ්නය අසනු ලබන ගරු මන්ත්‍රීතුමාගේ නම | : ගරු රවි ක |
| ප්‍රශ්නය අසනු ලබන දිනය | : 2013.01.24 |

Date : 24.01.13 Time: 2.20-25
MJ/CW/ANO/NEELA/ 01
Question No: 01
Type/Scan Pages: 01

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

"පවුල" යන සංකල්පය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන ක්‍රියාකාරකම් සඳහා භාවිතා නොකරන නමුත් "ගෘහ ඒකක" යන සංකල්පය භාවිතා කරනු ලැබේ. එබැවින් පවුල් ගණන පිලිබඳ සංඛ්‍යාත්මක තොරතුරු වෙනුවට ගෘහ ඒකක සංඛ්‍යාව ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සිටින ගෘහ ඒකක සංඛ්‍යාව : 5,079,362 වේ.
(ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10 (මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර))

(ii) ශ්‍රී ලාංකික පවුලක ඉපයීම් ප්‍රමාණය කොපමණද ;

ශ්‍රී ලංකාවේ ගෘහ ඒකකයක ඉපයීම් ප්‍රමාණය රු. 36,451 වේ.
(ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10 (මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර))

(ආ) දරිද්‍රතා රේඛාවට පහලින් සිටින පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක පදනමින් එතුමා සඳහන් කරන්නෙහිද ;

ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2009/10 (මන්නාරම, මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක හැර) පදනම් කොට පහත වගුවේ දක්වා ඇත.

| දිස්ත්‍රික්කය | දිළිඳු ගෘහ ඒකක සංඛ්‍යාව | දිළිඳු ගෘහ ඒකක ප්‍රතිශතය % |
|---|---|---|
| කොළඹ | 14,642 | 2.5 |
| ගම්පහ | 17,923 | 3.0 |
| කළුතර | 12,128 | 4.1 |
| මහනුවර | 28,889 | 8.3 |
| මාතලේ | 11,913 | 9.3 |
| නුවර එළිය | 13,490 | 7.1 |
| ගාල්ල | 21,995 | 7.9 |
| මාතර | 16,848 | 8.3 |
| හම්බන්තොට | 7,814 | 5.4 |
| යාපනය | 15,907 | 12.4 |
| වව්නියාව | 759 | 2.0 |
| මඩකලපුව | 22,601 | 17.0 |
| අම්පාර | 14,324 | 10.0 |
| ත්‍රිකුණාමලය | 7,083 | 9.0 |
| කුරුණෑගල | 36,360 | 8.6 |
| පුත්තලම | 15,936 | 7.5 |
| අනුරාධපුරය | 9,956 | 4.6 |
| පොළොන්නරුව | 4,838 | 4.5 |
| බදුල්ල | 24,046 | 10.9 |
| මොණරාගල | 16,699 | 13.9 |
| රත්නපුර | 24,398 | 8.5 |
| කෑගල්ල | 19,285 | 9.0 |
| **එකතුව** | **357,834** | **7.0** |